# මානව වංශ විවරණ පර්යේෂණ

-හඳගිරියේ සිරිසුමන හිමි

## ප්‍රවේශය

පර්යේෂණ ක්ෂේත්‍රයේ තුළ ගුණාත්මක පර්යේෂණ ක්‍රම (qualitative research), ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම (quantitative research) හා මිශ්‍ර පර්යේෂණ ක්‍රම (mixed methods research) වශයෙන් පර්යේෂණ පිරිසැලසුම් තෙවැදෑරුම් ය (ජයසේන සහ ඇම්බැක්ක, 2015 : 20,21). මානව වංශ විධි විවරණ පර්යේෂණ ක්‍රමය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අයත් සුවිශේෂ පර්යේෂණ ක්‍රමයකි. මානව වංශික, ස්වභාවවාදික, මානව විද්‍යාත්මක, ක්ෂේත්‍ර පර්යේෂණ හෝ සහභාගී නිරීක්ෂණ, විමර්ශනාත්මක ක්‍රම විද්‍යාව ආදිය යොදාග නිමින් සිදුකරනු ලබන පර්යේෂණ ක්‍රම හැඳින්වීමට භාවිත සූචක (Generic) පදයක් ලෙස 'ගුණාත්මක පර්යේෂණ' යන පදය භාවිත වේ (ජයසේන සහ ඇම්බැක්ක, 2015 : 44). ගුණාත්මක පර්යේෂණ ක්‍රමය පිළිබඳ විවිධ විචාරක මත දැකිය හැකි ය. මානව වංශ විධි විවරණ වෙනම පර්යේෂණ ක්‍රමයක් ලෙස ද ඇතමෙක් හඳුන්වා ඇත (ජයසේන සහ ඇම්බැක්ක, 2015 : 44). මානව වංශ විධි විවරණ 'Ethnography. යන්නෙහි වාච්‍යාර්ථය විමසීමේදී රොබට්සන්ට අනුව 'Ethno' යන්නෙන් 'ජන සමූහය' හැඳින්වෙන බවත්, Ethnography යන ග්‍රීක් වචනයෙන් බිඳී ආවක් බවත් දක්වයි (Robertson, 1981:13). එසේම 'Ethno' යන්නෙහි අදහස ජනතාව ලෙස ද 'graphy' යන්නෙහි අදහස විස්තර කිරීම ලෙස ද හුසේන් හා හුසේන් විග්‍රහ කරයි (Hussen) ussen,1997:68). මේ අනුව මානව වංශ විවරණ පර්යේෂණය යන්නට විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇති බව පෙනේ.

## සාකච්ඡාව

ටෆ්ට්ගේ අදහස අනුව මානව වංශ විවරණයෙන් සිදුවනුයේ සමාජ කණ්ඩායමක සංස්කෘතිය අනුව එම කණ්ඩායමේ සාමාජිකයන්ගේ පෞද්ගලික හා පොදු හැසිරීම පිළිබඳ සොයා බලා විස්තර කිරීමයි (Taft, 1998:59). එහෙත් මානව වංශ පර්යේෂණය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ හැමස්ලේ හා ඇට්කින්සන් ඉදිරිපත්

කරනුයේ, පර්යේෂකයා විවෘතව හෝ සංවෘත පුද්ගලයන් සමග දිනපතා හෝ තෝරාගත් කාලයක් තුළ ජීවත් වෙමින්, සිදුවන දේ බැලීම, සවන් දීම, ප්‍රශ්න මගින් විමසීම හා සාධක එකතුකිරීම තුළින් එම පුද්ගලයන් පිළිබඳව විග්‍රහයක් කිරීම බවයි (Hamamersley & Atkinson , 1983:02). මානව වංශ විවරණ පර්යේෂණයක දැකිය හැකි ලක්ෂණ කිහිපයක් ද මෙයින් පැහැදිලි වේ. එනම්, පර්යේෂකයා අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, පර්යේෂණ භූමියෙහිම නිශ්චිත කාල පරාසයක් රැඳෙමින් පර්යේෂණ භූමියෙහි සිදුවන දේ හොඳින් නිරීක්ෂණය කරමින් විවිධ උපක්‍රම ඔස්සේ තොරතුරු ගවේෂණයෙහි හා සංවිධානයෙහි නිරත වීම ආදියයි. ඒ අනුව මානව වංශ විවරණ පර්යේෂණයකින් පුද්ගල හා සිද්ධි පිළිබඳ සාක්ෂි සහිත සුපරීක්ෂාකාරී, පුළුල් විග්‍රහයක් සිදු වන බව පෙනේ.

මානව වංශ විවරණ සංස්කෘතික කණ්ඩායමක් විස්තර කිරීමේ ක්‍රමයක් වන අතර, සිද්ධි අධ්‍යයනයකට සමාන ය. පුද්ගලයා හා සම්බන්ධ වෙමින්, සහභාගීත්ව නිරීක්ෂණය මගින් තෝරාගත් කාලයක් තුළ ක්ෂේත්‍රයේ ගත කරමින් තොරතුරු ලබා ගැනීම මෙහදී සිදු කෙරේ. මානව වංශ විවරණ පර්යේෂණ පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත්ව ඇත. ඒ අනුව ඇතමෙකුට මෙම පර්යේෂණ දර්ශනාත්මක පර්යාලෝකයක් වන අතර ඇතමෙකුගේ පිළිගැනීම එය හුදෙක් දත්ත රැස් කිරීමේ ක්‍රමයක් පමණක් බවයි. එසේ ම සහභාගීත්ව නිරීක්ෂණය, ගුණාත්මක පර්යේෂණ, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන යන පද සමග යෙදීම ද මෙම පර්යේෂණ හඳුනා ගැනීමේදී ඇති වන ගැටලුවකි (ලේකම්ගේ, 2006 : 49). එසේ වුවත් මානව වංශ විවරණවල සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරන ජැන්කෝවාස්කි හා වෙස්ටර්ගේ (Jancovasky and Wester, 1991) අදහස වනුයේ එදිනෙදා චර්යාවන්හි සිට ආගම හා කලා ශිල්ප වැනි අති විශාල සමාජ සංස්ථා දක්වා වෙනස් වන විවිධාකාර සංස්කෘතික ස්වභාවයන් පිළිබඳව ආදිකාලීනව කෙරෙන නිරීක්ෂණ කෙරෙහි නැඹුරුවක් දක්වන බැවින් මානව වංශ විවරණ පර්යේෂණ අනෙකුත් ගුණාත්මක පර්යේෂණවලින් වෙනස් වන බවයි (ලේකම්ගේ, 2006 : 49). මේ අනුව විමසා බැලීමේදී මානව වංශ විවරණ සුවිශේෂී පර්යේෂණ ක්‍රමයක් වශයෙන් හඳුනා ගත හැකි ය. එහිදී පර්යේෂණ ක්ෂේත්‍රය, කාලය, පුද්ගලයන් හා පර්යේෂණය සඳහා ප්‍රස්තුත සියලු කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු බව හඳුනාගත හැකි ය.

සමාජීයවිද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයේ ජනප්‍රිය පර්යේෂණ ක්‍රමයක් වන මානව වංශ විවරණ, අප්‍රිකාව, ලතින් ඇමරිකාව හා ඔෂනියාව ආදී විවිධ රටවල ගෝත්‍රික සමාජයන්හි, ඔවුන්ගේ චර්යා රටා, සංස්කෘතීන්, විශ්වාස පද්ධති හා අගයන් අධ්‍යයනය කිරීම සඳහා යොදා ගෙන ඇත. ඇරපෙෂ් හා මුණ්ඩුගුමෝර් (Arapesh and Mundugumor) වැනි ගෝත්‍රික සමාජ පිළිබඳව මීඩ් (Mead) විසින් කරන ලද අධ්‍යයන මේ සඳහා උදාරණයකි. එසේ ම ලාංකේය සංදර්භය තුළ නන්දසේන රත්නපාල විසින් කරන ලද 'ශ්‍රී ලංකාවේ යාචකයෝ,' 'පොලිසිය හා ගණිකා වෘත්තිය' වැනි අධ්‍යයන මෙන්ම, මොණරාගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය පිළිබඳ බේකර් විසින් කරන ලද 'වනගත කළුලෑල්ල' (Black Board in the Jungle) මෙකී මානව වංශ විවරණ ක්‍රමය අනුව කරන ලද පර්යේෂණ වේ. මේ අනුව සමාජයක වෙසෙන සාමාජීය කණ්ඩායමක ලක්‍ෂණ විවිධ පැතිකඩ ඔස්සේ එකී කණ්ඩායම සමග වෙසෙමින්, අන්තර් සබඳතා පවත්වමින් පුළුල් හා සවිස්තරාත්මකව අධ්‍යයනය කිරීමේ විධිමක් ක්‍රියාවලිය මානව වංශ විවරණ පර්යේෂණ වේ. අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ගැටලු නිරාකරණය විෂයෙහි ද මෙම පර්යේෂණ ක්‍රමය මැනවින් යොද ගත හැකි ය. ඒ අනුව සහභාගීත්ව නිරීක්‍ෂණය තුළින් ශිෂ්‍ය භූමිකා, ගුරු භූමිකා, විදුහල්පති භූමිකාව, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය, පාසල් ප්‍රජාව හා පාසල් සංස්කෘතිය ආදිය අධ්‍යයනය කළ හැකි ය.

**මානව වංශ විවරණ පර්යේෂණවල ලක්‍ෂණ :**

මෙම පර්යේෂණ ක්‍රමයෙහි ලක්‍ෂණ පිළිබඳ විමසීමේ දී ඇට්කින්සන් හා හැමර්ස්ලි (Atkinson) Hammersley,1994) මූලික ලක්ෂණ 04 ක් ඉදිරිපත් කර ඇත.

1. මානව වංශ විවරණ පර්යේෂණ උද්ගාමී ස්වරූපයක් ගනියි. එනම්, පර්යේෂකයා රැස්කරගන්නා ප්‍රාථමික අත්දැකීම් න්‍යාය සංවර්ධනය සඳහා යොමු වේ.
2. මානව වංශ විවරණ පර්යේෂණ මගින් රැස්කරගන්නා තොරතුරු විවිධ අර්ථකථන සඳහා විවෘත වේ. එමගින් පිළිබිඹු කරන්නේ එම තොරතුරුවල ඇති විස්තරාත්මක ස්වරූපයයි.

3. ඉතා කුඩා පුද්ගල කණ්ඩායමක් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් සඳහා යොමුවේ.

4. එම කණ්ඩායමේ භාෂාව හා ක්‍රියාකාරීත්වය පිළිබඳව ඉතා පුළුල් අර්ථකථන වලින් සංයුක්ත වූ විශ්ලේෂණයක් ඇත (ලේකම්ගේ, 2006 : 49).

හිච්කොක් හා හුග්ස්ට (Hitchcock Hughes,1995) අනුව මානව වංශ විවරණ පර්යේෂණවල අන්තර්ගත ලක්ෂණ හයකි. එනම්,

- කණ්ඩායමක් පිළිබඳ විස්තරාත්මක හා සංස්කෘතිකමය දැනුමක් නිෂ්පාදනය කිරීම
- එම කණ්ඩායමෙහි සාමාජිකයන්ගේ අදහස් වලින් එක්තරා සංස්කෘතික සංදර්භයකට අදාළ ක්‍රියාකාරීත්ව පිළිබඳ විග්‍රහ කිරීම
- කණ්ඩායමක හෝ සංස්කෘතියක සාමාජිකත්වයෙහි ලක්ෂණ පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම
- සමාජ අන්තර් ක්‍රියාවන්හි රටාවන් විස්තර කිරීම හා විශ්ලේෂණය කිරීම
- හැකිතාක් දුරට අභ්‍යන්තර ඇගයීමක් ලබාදීම
- න්‍යායන් ගොඩ නැගීම ආදී වශයෙනි (ලේකම්ගේ, 2006 : 50).

පර්යේෂකයාගේ සමාජ භූමිකාව (සහභාගී නිරීක්ෂකයෙකු ලෙස හා කණ්ඩායමෙහි සාමාන්‍ය සාමාජිකයෙකු ලෙස) අභ්‍යන්තර හා බාහිර දැක්ම මෙන් ම පර්යේෂකයාගේ පුද්ගල බද්ධ බව, වලංගුතාව හා විශ්වසනීයතාව ආදී වශයෙන් මානව වංශ විවරණ පර්යේෂණ ක්‍රමයේ විද්‍යාත්මක පැතිකඩක ද අවධාරණය කරමින් එහි ලක්ෂණ පිළිබඳ පැහැදිලි කිරීමක් ද දැකිය හැකි ය. ජයසේන හා ඇම්බැක්ක මූලික පොදු ලක්ෂණ තුනක් ඔස්සේ මෙය සාකච්ඡා කරයි. එනම්,

1. අර්ථ
2. ස්වභාවික සන්දර්භය
3. පර්යේෂකයාගේ භූමිකාව වශයෙනි (2015 : 44,45).

## 01. අර්ථය (Meaning)

අර්ථය යන්නෙන් තොරතුරු අර්ථකථනය කිරීම අර්ථවත් කරයි. පර්යේෂකයා සතු තොරතුරු නොයෙක් ආකාරයට අර්ථකථනය කිරීමේ කුසලතාවක් පර්යේෂකයාට පැවතිය යුතු ය. පුද්ගලයා විවිධ සාධක පදනම් කර ගෙන සිය අනන්‍යතාව ගොඩ නගා ගනිමින් අන්‍යයන් සමග අන්තර් ක්‍රියාවලියකට යොමු වන්නේ යම්සේ ද එසේ ම පර්යේෂකයාට විචල්‍ය අතර අන්තර් ක්‍රියාකරණය වැදගත් වේ. පර්යේෂකයා සිය පර්යේෂණයේදී ඕනෑම ක්‍රියාවකට දෙන අර්ථකථනය වැදගත් බව මේ අනුව පැහැදිලි වේ.

ඇට්කින්සන් හා හැමස්ලිගේ (Atkinson & Hammersley) අදහස් අනුව මානව වංශ විවරණ පර්යේෂණවල මූලික ලක්ෂණ අතර, ''මානව වංශ විවරණ පර්යේෂණ මගින් රැස්කරගන්නා දැනුම විවිධ අර්ථකථනයන් සඳහා විවෘත වේ.'' යනුවෙන් විග්‍රහ කර ඇත්තේ ද මෙකී සාධකයයි (ලේකම්ගේ, 2006 : 49). සහභාගීත්ව නිරීක්ෂණ, ලේඛන තොරතුරු, සම්මුඛ සාකච්ඡා හා භාෂීය අභාෂීය සංනිවේදන, නිරීක්ෂණය ආදී ක්‍රම මගින් පර්යේෂකයා ලබාගත් දැනුම පිළිබඳ පර්යේෂකයාට අර්ථ දැක්විය හැකි ය. මේ අනුව අර්ථය යන සාධකය මානව වංශ විවරණ පර්යේෂණවල වැදගත් ලක්ෂණයක් වශයෙන් හැඳින්විය හැකි ය.

## 02. ස්වභාවික සන්දර්භය

සෑම අර්ථවත් සංසිද්ධියක් ම ස්වභාවික සන්දර්භය තුළ අධ්‍යයනය කිරීම මානව වංශ විවරණ පර්යේෂණයේ තවත් සුවිශේෂී ලක්ෂණයකි. පර්යේෂණය දියත් කිරීමේදී පර්යේෂකයා එකී සන්දර්භය තුළ ජීවත්විය යුතු ය යන ලක්ෂණය විග්‍රහ කරන මැලිනොව්ස්කි (Malinoviski) සෑම පර්යේෂකයෙකුම තමා අධ්‍යයනයට පාත්‍ර කරන සිද්ධිය, පුද්ගලයා හෝ ප්‍රපඤ්චය ආශ්‍රිත යථාර්ථය අවබෝධ කර ගැනීමට නම් එම අධ්‍යයනයට පාත්‍රවන දෙයට අදාළ සංස්කෘතිය තුළම එම දේ අධ්‍යයනයට පාත්‍ර කළ යුතුයැයි දක්වා තිබේ (ජයසේන සහ ඇම්බැක්ක, 2015 : 45).

මේ අනුව පර්යේෂකයා පර්යේෂණ භූමිය තුළ රැඳී සිටිමින් එකී සංස්කෘතිය තුළ ම සංසිද්ධිය අධ්‍යයනය කළ යුතු ය. උදාහරණ වශයෙන් වික්ටෝරියා බේකර්ගේ 'වනගත කළුලෑල්ල' (Black Board in the Jungle) හා නන්දසේන රත්නපාලගේ 'ශ්‍රී ලංකාවේ යාචකයෝ' පර්යේෂණ සිදු කර ඇත්තේ පර්යේෂණ භූමියෙහි රැඳී සිටීමෙන් ය. එසේම මාග්‍රට් මීඩ් (Mead) විසින් ඇරපෙෂ් හා මුණ්ඩුගුමර් (Arapesh and Mundugumor)ගෝත්‍රික සමාජ පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ ද මෙම වර්ගයේ සුවිශේෂී පර්යේෂණ වේ. එය සිදු කරනු ලැබුයේ ද ස්වභාවික සන්දර්භය තුළ ය. එමගින් පර්යේෂකයාට ස්වභාවික සංදර්භය තුළ යථාර්ථය විවිධ සාධක සහිතව පසක් කරගත හැකි ය. පර්යේෂණය ස්වභාවික පරිසරයේ දියත් කරන හෙයින් පර්යේෂකයාට ඇවැසි පරිදි පර්යේෂණය හැසිරවීමට අවස්ථාව නොමැතිවීම ද මෙහිදී වැදගත් ය. සිය පර්යේෂණ ප්‍රශ්න හා අරමුණු පර්යේෂණය දියත් කරන පරිසරයට උචිත ලෙස සකස් කළ යුතු ය. ස්වභාවික සන්දර්භය තුළ සිදුවන හෙයින් කලින් තීරණය කළ පර්යේෂණ සැලැස්ම වෙනස් කිරීමට ද, අලුතින් සැකසීමට ද පර්යේෂකයාට ඇතැම් විට සිදු වේ. එය මානව වංශ විවරණ පර්යේෂණවල දැකිය හැකි ලක්ෂණයකි.

### 03. පර්යේෂකයාගේ භූමිකාව

මානව වංශ විවරණ පර්යේෂණ ක්‍රමය අනුගමනය කරන පර්යේෂකයා අර්ථ නිරූපණය කරන වේදයකු ලෙස (Intepretive Subject) ජයසේන හා ඇම්බැක්ක දක්වයි (2015 : 46). සමස්ත පර්යේෂණ ක්‍රියාවලිය කෙරෙහි පර්යේෂකයාගේ මැදිහත් වීම අත්‍යවශ්‍ය හෙයින් පිළිගත් භූමිකාවක් නිරූපණය කරමින් පර්යේෂණ භූමියට ඇතුළු විය යුතු ය. පර්යේෂකයා සමාජ භූමිකාවේදී සහභාගීත්ව නිරීක්ෂකයෙකු ලෙස පර්යේෂණ ක්‍රියාවලිය සිදුවන ජන සමාජයට ප්‍රවේශවීමේ දී පර්යේෂකයා එකී ජනසමාජයේ අන්තර් පුද්ගල සම්බන්ධතා, පුද්ගල චර්යා රටා, ආකල්ප හා අගයන්, චින්තනයන් පිළිබඳව නිරීක්ෂණය කළ යුතු ය. පාතාල ලෝකය, මත් ද්‍රව්‍ය වෙළදාම හා වෙනත් සමාජීය සාපරාධී ක්‍රියා සහිත අංශ පර්යේෂණය සඳහා යොදා ගනී නම් එහිදී පර්යේෂණ භූමියෙහි දී පර්යේෂකයාට මුහුණදීමට සිදුවන ගැහැට හා තර්ජන ද සැලකිලිමත් විය යුතු ය. පර්යේෂණ ජන කණ්ඩායමේ ම

සාමාජිකයෙකු වශයෙන් සමාජගත වීම මෙහිදී විශේෂයෙන් වැදගත් වේ. වික්ටෝරියා බේකර්ස් සිය පර්යේෂණයේදී 'ගුරුවරයෙකු' ලෙස ජන සමාජයේ සාමාජිකයෙකු වූ අතර නන්දසේන රත්නපාල 'යාචක' වෙස් ගෙන නිත්‍ය සාමාජිකයෙක්ව යාචක සමාජයේ කටයුතු කර ඇත. පර්යේෂකයාගේ අභ්‍යන්තර හා බාහිර දෘෂ්ටිය, පර්යේෂකයාගේ භූමිකාවේදී වැදගත් සාධකයකි. පර්යේෂණයට පාත්‍ර කරගනු ලබන ජන සමාජය පිළිබඳව තාත්වික හා යථාර්ථවාදී අව්‍යාජ අත්දැකීම් ලබාගැනීම, පර්යේෂණයේ සාර්ථකත්වයට ඉවහල් වේ. අභ්‍යන්තර දෘෂ්ටියෙන් ජන සමාජය දෙස බැලීමට නම් පර්යේෂකයා සාමාන්‍ය සාමාජිකයෙකු වශයෙන් ජන සමාජයට සම්බන්ධ විය යුතු ය. එවිට යම් යම් සිද්ධි සම්බන්ධයෙන් ඔවුන් ලබාදෙන අර්ථකථන ඔවුන්ගේ ම දෘෂ්ටියෙන් දැකීමේ හැකියාව ලැබේ. මේ අනුව පර්යේෂකයාගේ භූමිකාව මෙහිදී වැදගත් ලක්ෂණයක් බව හඳුනාගත හැකි ය.

විවිධ ලක්ෂණවලින් සමන්විත මානව වංශ විවරණ පර්යේෂණ දත්ත ත්‍රිකෝණීකරණය කරමින් කතාන්තර ක්‍රමයෙන් ඉදිරිපත් කිරීම එහි ලක්ෂණයකි. එබැවින් එය වර්ණනාත්මක කතා මාලාවක් යැයි ද හැඳින් වේ. සහභාගීත්ව නිරීක්ෂණය, විධිමත් සම්මුඛ සාකච්ඡා, අවිධිමත් සාකච්ඡා, ලේඛනගත දත්ත පිරික්සීම හා ප්‍රශ්නාවලි ආදී දත්ත ලබා ගැනීමේ විවිධ උපකරණ හරහා ලබාගත් දත්ත එකිනෙක හප්පමින් දත්තවල විශ්වසනීයතාව හා වලංගුතාව විමසීමෙන් දත්ත අර්ථකථනය කළ යුතු ය. දත්ත එකිනෙක ගළපා බැලීමේ එම ක්‍රියාවලිය හෙවත් ලබාගත් දත්ත වෙනත් ක්‍රම මගින් සනාථ කර ගැනීම දත්ත ත්‍රිකෝණීකරණය නම් මානව වංශ විවරණ පර්යේෂණයේදී ද නිරීක්ෂණය මගින් ලත් දත්ත මත පමණක් පදනම්ව නිගමනවලට එළඹීම සුදුසු නොවන අතර ඒ සඳහා වෙනත් ක්‍රම මගින් ද, දත්ත ලබාගනිමින් නිගමනවලට එළඹීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව පර්යේෂණ භූමියෙහි සාමාජිකයෙක්ව ජීවත් වෙමින්, සහභාගීත්ව නිරීක්ෂණය මූලික කර ගනිමින් සිදු කරන පර්යේෂණ ක්‍රමයක් ලෙස මානව වංශ විවරණ පර්යේෂණ හඳුනාගත හැකි අතර එය අධ්‍යාපන පර්යේෂණ සඳහා භාවිත කළ හැකි යෝග්‍ය වූ පර්යේෂණ ක්‍රමයක් වශයෙන් ද හඳුනා ගත හැකි ය.

**මානව වංශ විවරණ පර්යේෂණයක පියවර**

මානව වංශ විවරණ පර්යේෂණ අනෙක් පර්යේෂණවලට වඩා විවෘත හා නම්‍යශීලී බවකින් දියත් කළ හැකි බව එහි අර්ථ ක්‍රියාකාරීත්වය තුළින් පිළිබිඹු වේ. පූර්ව කල්පිත හෝ පර්යේෂණ ප්‍රශ්න නොමැතිව වුව ද පර්යේෂණය දියත් කළ හැකි වුව ද එහි වඩා සාර්ථකත්වය උදෙසා පූර්ව සැලැස්මක් තිබීම වැදගත් වේ. එකී සැලැස්ම හෝ පූර්වයෙන් නිශ්චිත කර ගන්නා ලද අරමුණු වෙනස් කරමින් මෙය දියත් කළ හැකි වීම මෙහි සුවිශේෂ ලක්ෂණයයි. කෙසේ වුව ද, මානව වංශ විවරණ පර්යේෂණයක ද නිශ්චිත පියවර ඔස්සේ ගමන් කිරීම තුළින් පර්යේෂණ සාර්ථකත්වයට ළඟාවීම පහසු වේ. ඒ අනුව මානව වංශ විවරණ පර්යේෂණවලදී අනුගමනය කළ හැකි පියවර පිළිබඳ විවිධ අදහස් දැකිය හැකි අතර එම අදහස් විමසීමෙන් පොදුවේ මෙම පර්යේෂණ දියත් කළ හැකි ආකාරය හඳුනා ගත හැකි ය.

1. ක්ෂේත්‍රයක් හඳුනා ගැනීම
2. භූමිකාවන් හඳුනා ගැනීම හා සුළුවෙන් ක්ෂේත්‍රයට ඇතුළුවීම
3. පරීක්ෂිතයන් හඳුනා ගැනීම
4. ක්ෂේත්‍ර සම්බන්ධතා ගොඩ නැගීම
5. ක්ෂේත්‍රය තුළ දත්ත රැස් කිරීම
6. ක්ෂේත්‍රයෙන් පිටත දත්ත රැස් කිරීම
7. විශ්ලේෂණය (Hitchcock & Hughes,1995 : 56).

මෙකී පියවර හත පර්යේෂකයෙකු දැඩිව අනුගමනය කළ යුතු පියවර නොවන බව ද, එකී පියවර ගැටලුකාරී බව ද දයාලතා ලේකම්ගේ අදහසයි (2006 ඃ 54). එසේ ම,

1. පර්යේෂණ ක්ෂේත්‍රය තෝරා ගැනීම
2. පර්යේෂණ ක්ෂේත්‍රයට ඇතුළු වීම
3. ක්ෂේත්‍රයේ ම පුද්ගලයෙකු බවට පත්වීම
4. තොරතුරු හා දත්ත රැස් කිරීම
5. තොරතුරු විශ්ලේෂණය හා න්‍යායික පසුබිම සංවර්ධනය කිරීම

යන පියවර ද මානව වංශ විවරණ පර්යේෂණ සිදු කිරීමේ පියවරයි (Singleton etal, 1988:306). මේ අනුව විමසීමේදී මෙම පර්යේෂණය දියත් කිරීමේ පියවර පිළිබඳ විවිධ අදහස් පවතින බව පෙනේ. කෙසේ වුව ද, මෙම පියවර පිළිබඳ කෙටි විමසීමක් පහතින් සිදු කරනුයේ, මෙම ක්‍රමය ප්‍රායෝගිකව අනුගමනය කරන ආකාරය හඳුනා ගැනීමට ය.

**1. පර්යේෂණ ක්ෂේත්‍රය හඳුනා ගැනීම**

පර්යේෂකයාගේ පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීම සඳහා මානව වංශ විවරණ පර්යේෂණය දියත් කිරීමට උචිත ක්ෂේත්‍රයක් තෝරා ගැනීම හා එහි නිශ්චිත සීමා තීරණය කර ගැනීම මෙයින් අදහස් කෙරේ. තෝරාගත් ක්ෂේත්‍රයේ ඇති තොරතුරු මෙන් ම ක්ෂේත්‍රයෙන් පිටත තොරතුරු හඳුනා ගැනීම වැදගත් වේ. ක්ෂේත්‍රයේ ප්‍රමාණය, ඇතුළත් වන පුද්ගලයන් සංඛ්‍යාව, තෝරා ගන්නා ප්‍රධාන භූමිකා, තේමා හා දත්ත රැස් කිරීමේ මූලාශ්‍රය පිළිබඳ අවබෝධයක් ද මෙහිදී තිබිය යුතු අතර පර්යේෂණයේදී ඇති විය හැකි ගැටලු හඳුනා ගැනීම ද වැදගත් වේ. හාමස්ලේ හා ඇට්කින්සන් මානව වංශ විවරණ පර්යේෂණයක දී පර්යේෂණ ක්ෂේත්‍රය තෝරාගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පහක් දක්වා ඇත.

1. හුරු පුරුදු නොවන ආගන්තුක ක්ෂේත්‍රයක් වීම. (එහිදී පූර්ව විනිශ්චයන් නොමැති නිසා පුද්ගල අගතිය බල නොපාන්නේ වෙයි.)
2. පහසුවෙන් ළඟාවිය හැකි, සරල තැනක් වීම හා අවුල් සහගත ස්ථානයක් නොවීම.
3. අවසර ලබාගත හැකි වීම හා නිරීක්ෂණයට පහසු වීම.
4. බාධා රහිත තැනක් වීම හා පර්යේෂකයාගේ අභිමතය පරිදි නිරීක්ෂණය කිරීමට පාලක අංශය හා අනෙක් අංශවලින් බාධා ඇති නොවිය යුතු ය.
5. සහභාගීත්වය සහිත තැනක් වීම හා තමන්ට අවශ්‍ය පරිදි අන් අයගේ සහයෝගය ලබාගත හැකි වීම (සේනාධීර සහ වනසිංහ, 2016 : 141).

මේ අනුව මානව වංශ විවරණ පර්යේෂණයකදී, පළමු පියවර වන පර්යේෂණ ක්ෂේත්‍රය හඳුනා ගැනීම මැනවින් සිදු කළ යුතු කාර්යයක් බවත්, පර්යේෂණය සාර්ථකව දියත් කිරීම විෂයයෙහි එය ඉතා සුවිශේෂී වූවක් බවත් මේ අනුව හඳුනාගත හැකි ය.

### 02. පර්යේෂණ ක්ෂේත්‍රයට ඇතුළුවීම

පර්යේෂණ භූමියකට හෙවත් ක්ෂේත්‍රයකට ඇතුල්වීම මෙහි දෙවන ප්‍රධාන පියවරයි. පර්යේෂණ භූමියට යාමට පෙර අදාළ වගකීම් දරන්නන්ගෙන් අවශ්‍ය අවසරය ලබාගත යුතු ය. නිදසුන් වශයෙන්, අධ්‍යාපනයට අදාළ පර්යේෂණයක් නම් පළාත් හෝ කලාප අධ්‍යක්ෂවරුන්ගෙන් නිසි අවසරය ගත යුතු ය. මත්ද්‍රව්‍ය ආදී සමාජ සාපරාධී කරුණු පිළිබඳ කෙරෙන පර්යේෂණයක් නම් ඒ පිළිබඳ ආරක්ෂක අංශ දැනුවත් කිරීම හා අවසර ගැනීම පර්යේෂකයාගේ ආරක්ෂාවට වඩාත් වැදගත් ය. තොරතුරු ලබාගැනීම උදෙසා සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, ප්‍රශ්නාවලි ආදිය ඇසුරින් දත්ත ලබා ගැනීමට පෙර ද යම්කිසි ක්‍රමානුකූල පිළිවෙළක් සකස්කර ගැනීම මෙන්ම, නිශ්චිත කාල පරාසයක් තුළ පර්යේෂණය අවසන් කිරීමට පර්යේෂකයාට උපාය මාර්ග භාවිත කිරීමට සිදු වේ.

පර්යේෂණ භූමියේ පවතින පොදු විනය නීතිවලට අවනත වෙමින්, එම නීති ආරක්ෂා කරමින් සිය පර්යේෂණ කාර්යයෙහි නියැලීම පර්යේෂකයාගේ යුතුකමකි. පොදු නීති රීතිවලට අමතරව පර්යේෂකයා විසින් සකසා ගත් නීති රීති හා ප්‍රතිපත්තියක් පැවතීම ද යෝග්‍ය ය. හැම පර්යේෂකයෙකුම ඉතා ආරක්ෂිත ලෙස ක්ෂේත්‍රයට ඇතුළු වීමට මෙන් ම ඒ සඳහා අවසර ලබාගැනීමට අවශ්‍ය පූර්ව විධිවිධාන යෙදිය යුතු අතර ම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට පැහැදිලි හේතුවක් හා සුදුසු භූමිකාවක් පිළිබඳ සැලසුම් ද සකස් කරගත යුතු බව වොල්කර්ගේ අදහසයි (Walker,1980:49). මේ සඳහා ඉතාමත් මෘදු එළඹුමක් වඩාත් සුදුසු බවත්, ක්ෂේත්‍රයට ඇතුලුවීම හා එහි සිය භූමිකාව ගොඩනගා ගැනීම ප්‍රධානියාගේ ආධාරයෙන් කළ හැකි බවත් හිච්කොක් හා හුග්ස්ගේ අදහසයි (Hitchcock & Hughes,1993 : 56).

## 03. ක්ෂේත්‍රයේ ම පුද්ගලයෙකු බවට පත්වීම

පර්යේෂකයාට අවශ්‍ය තොරතුරු වඩා නිවැරදිව හා විශ්වසනීයත්වයෙන් යුතුව ලබාගැනීමට පර්යේෂණයට ලක්වන්නන් හා පර්යේෂකයා අතර මනා සමාජ අන්තර්ක්‍රියාකාරීත්වයක් ගොඩනගා ගත යුතු ය. මෙහිදී පර්යේෂණය සඳහා තොරතුරු ලබාගන්නා පුද්ගලයන් හඳුනාගැනීම අත්‍යවශ්‍ය ය. මූලිකවම පර්යේෂණය සඳහා සියලු දෙනා ම තෝරාගත්ත ද පර්යේෂණයේ අවසන් අදියරේදී ඉන් කිහිප දෙනෙකුට පමණක් සීමාවිය හැකි ය. නිදසුනක් වශයෙන්, 'පාසල' පර්යේෂණ භූමිය වශයෙන් තෝරාගත් පර්යේෂණයක, පාසල් සිසුන්ගෙන් පමණක් දත්ත ලබාගැනීම යෝග්‍ය නොවේ. ඒ සඳහා ගුරුවරු, විදුහල්පති, දෙමාපියන් ආදී බහුවිධ කණ්ඩායම් ආශ්‍රයෙන් දත්ත ලබාගැනීම වඩා උචිත ය. එමගින් දත්තවල වලංගුතාව හා විශ්වසනීයත්වය ආරක්ෂා කර ගත හැකි ය. එමෙන් ම පර්යේෂකයා ලබාගන්නා දත්තවල වලංගුතාව තහවුරු වීමට නම් එකී තොරතුරු ලබාදෙන පරීක්ෂිතයන් හා පර්යේෂකයා අතර විශ්වාසී හා සමීප සහසම්බන්ධතාවක් ගොඩනගා ගත යුතු ය. මෙහිදී තමාට තොරතුරු ලබාදෙන පුද්ගලයන් සමග සම්බන්ධතා පැවැත්වීමේ දී තමාට ශක්තියක් හා මගපෙන්වීමක් ලබාදෙන පුද්ගලයන් පිළිබඳව අවබෝධයෙන් ද සිටිය යුතු ය.

## 04. තොරතුරු හා දත්ත රැස් කිරීම

පර්යේෂකයෝ විවිධ ශිල්ප ක්‍රම මගින් දත්ත රැස්කරති. මානව වංශ විවරණ පර්යේෂණ ක්‍රමවේදයේ දී බොහෝවිට වාචික හා අවාචික සන්නිවේදන ආශ්‍රයෙන් දත්ත රැස්කිරීම සිදු වේ. මෙහිදී සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, නිරීක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි, සහ ලිපි ලේඛන ආදී වෙනත් පර්යේෂණ සඳහා දත්ත ලබා ගන්නා ඕනෑම දත්ත ලබා ගැනීමේ උපකරණයක් මගින් දත්ත රැස්කර ගත හැකි ය. වාචික දත්ත රැස්කිරීමේදී පරීක්ෂිතයන්ගේ භාෂා ව්‍යවහාරයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් පර්යේෂකයාට පැවතීම ද වැදගත් ය. එමෙන් ම අවාචික සන්නිවේදනය පිළිබඳව ද ප්‍රමාණවත් අවබෝධයක් පැවතිය යුතු ය. භාෂා ව්‍යවහාරයේ පවතින සියුම් ව්‍යවහාර පිළිබඳව මනා අවබෝධයක් පැවතීම පර්යේෂකයාට අවශ්‍ය තොරතුරු

ලබාගැනීමට මනා පිටුබලයක් වේ. ට්‍රැෆ්ට් (Traft) අනුව, කණ්ඩායමට අමුත්තෙකු, මිත්‍රයෙකු ලෙසින් ඇතුළු වී එම කණ්ඩායමේ පුද්ගලයන් අතර සන්නිවේදනය සඳහා භාවිත කරන නිශ්ශබ්ද භාෂාව හෙවත් සංඥා භාෂාව පිළිබඳව ද දැනගත යුතු ය (සේනාධීර සහ වනසිංහ, 2016 : 150). මානව වංශ විවරණ පර්යේෂණවල ප්‍රධාන දත්ත ලබා ගැනීමේ මෙවලම වනුයේ සහභාගීත්ව නිරීක්ෂණයයි. එනම්, පර්යේෂණ භූමියේ ම සාමාජිකයෙක්ව විවිධ පැතිකඩ ඔස්සේ නිරීක්ෂණය කරමින් දත්ත ලබා ගැනීමයි. ඇතැම් සිද්ධි නිරීක්ෂණය කරමින්, ඒ පිළිබඳ ගැඹුරු අධ්‍යයනයෙන්ද ඇතැම් විට සාකච්ඡාවක් නම් එම සාකච්ඡාවේ ම සාමාජිකයෙක් ව සිටිමින් ද දත්ත රැස් කර ගත හැකි ය.

## 05. දත්ත විශ්ලේෂණය

ඕනෑම පර්යේෂණයක වැදගත් ම පියවර දත්ත විශ්ලේෂණය හා අර්ථකථනයයි. එමගින් නිගමන හා යෝජනා ද ඉදිරිපත් කෙරේ. විවිධ උපාය මාර්ග ඔස්සේ ලබාගත් දත්ත එකිනෙකට සසඳමින් පර්යේෂකයා තොරතුරු ඉදිරිපත් කිරීම දත්ත විශ්ලේෂණයේදී සිදු කෙරේ. එය දත්ත ත්‍රිකෝණීකරණය නම් වේ. දත්ත විශ්ලේෂණය කිරීමේ ක්‍රමය පර්යේෂණ ක්‍රමය අනුව වෙනස් වේ. නිදසුන් වශයෙන්, ගුණාත්මක දත්ත තේමාකරණය මගින් විස්තරාත්මකව ඉදිරිපත් කළ හැකි අතර, ප්‍රමාණාත්මක දත්ත පරිගණක මෘදුකාංග (Excell, SPSS) ඇසුරින් විශ්ලේෂණ කළ හැකි ය.

මානව වංශ විවරණ පර්යේෂණයක දත්ත විශ්ලේෂණය සිදු කරනුයේ කතාවක ස්වරූපයෙනි. එය වර්ණනාත්මකව විවිධ මාතෘකා හෝ සිද්ධි වශයෙන් වෙන් කර ගනිමින් අලංකාරවත්ව ඉදිරිපත් කළ හැකි ය. යොදා ගන්නා පර්යේෂණ ප්‍රස්තුතයට අනුව භාවිත වාග් මාලාව ද වෙනස් විය හැකි ය. වාග් මාලාව සරල වීම යෝග්‍ය ය. අධ්‍යයනයට ලක් වන පර්යේෂණ භූමිය අනුව ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර වෙනස්වීම මෙන් ම, විවිධ සමාජ කණ්ඩායම් අතර සන්නිවේදනය වන භාෂාව ද වෙනස් වේ. බොහෝ විට මානව වංශ විවරණ පර්යේෂකයාට සිය පර්යේෂණ භූමියේ භාවිත වාග් ස්වරූපයන් ද යොදා ගැනීමට සිදු වේ. නිදසුන් වශයෙන්, යාචක සමාජයේ භාෂාව, ගණිකා වෘත්තියේ නියැලෙන සමාජයේ භාෂාව, මත් ද්‍රව්‍ය බෙදා

හැරීමේ පුද්ගලයන් භාවිත භාෂාව හාත්පසින් ම එකිනෙකින් වෙනස් වේ. එසේ ම ඔවුන්ගේ අවාචික සන්නිවේදන ක්‍රම ද වෙනස් වේ. ඒ අනුව මානව වංශ විවරණ පර්යේෂකයා සිය දත්ත විශ්ලේෂණය යථෝක්ත සාධක කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කළ යුතු අතර පර්යේෂණ වාර්තාව පාඨක රසවින්දනය සඳහා උචිත වාග්මාලාවක් භාවිත කරමින් වෘතාන්ත ස්වරූපයෙන් ඉදිරිපත් කළ යුතු ය.

**සමාලෝචනය**

මානව වංශ විවරණ පර්යේෂණ සමාජීයවිද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රකට පර්යේෂණ ක්‍රමයකි. සමාජ කණ්ඩායමක සංස්කෘතිය, චර්යා රටාවන්, භාෂාව, සිරිත් විරිත්, ඇදහිලි හා විශ්වාස ආදිය එම ජන සමාජයේ ම ජීවත් වෙමින්, ගැඹුරින් අධ්‍යයන කර, එම ජන සමාජයේ අර්ථ ක්‍රියාකාරීත්වය විවරණය කිරීම මානව වංශ විවරණ පර්යේෂණ මගින් සිදු වේ. දත්ත රැස් කිරීම සඳහා යොදා ගන්නා විවිධ පර්යේෂණ උපකරණ මෙම පර්යේෂණ සඳහා ද යොදාගත හැකි වුව ද, සහභාගීත්ව නිරීක්ෂණය ඉන් ප්‍රමුඛ වේ. දත්ත විශ්ලේෂණය කරමින්, පර්යේෂණ වාර්තාව රසවත් කථාවක් ලෙස ඉදිරිපත් කිරීම ද මෙම පර්යේෂණවල ප්‍රධාන ලක්ෂණයකි. එසේ ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටලු විසඳා ගැනීම සඳහා ද මෙම පර්යේෂණ ප්‍රවේශය මැනවින් යොදාගත හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

උයන්ගොඩ, ජයදේව (2014). **සමාජීය-මානවීය විද්‍යා පර්යේෂණ.** කොළඹ 05ඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

උයන්ගොඩ, ජයදේව (2016). **සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම.** කොළඹ 05ඃ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

කොඩිතුවක්කු, ගොඩ්වින් (2014). **අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පරීක්ෂණ පර්යේෂණ.** කතෘ ප්‍රකාශන

ජයසූරිය, චන්ද්‍රා (2007). **අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප.** දෙහිවලඃ ශ්‍රීදේවි මුද්‍රණ

ජයසේන, අශෝකා සහ සුසිලා කුමාරි ඇම්බැක්ක, (2015). **පර්යේෂණ ක්‍රමවිද්‍යා ප්‍රවේශය.** මරදානඃ ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ.

පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ, (2016). **පර්යේෂණ නිබන්ධ අත්පොත,** කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, ඥානදාස (2011). **පර්යේෂණ ක්‍රමවේද**. කොළඹඃ සහස්‍ර ප්‍රකාශකයෝ.

ලලිතධීර, කේ. ඒ. (2018). **පර්යේෂණ ක්‍රමවේදය සහ ක්‍රම**, මහරගමඃ එල්. එම්. ඩී ප්‍රකාශකයෝ.

ලේකම්ගේ, දයාලතා (2006). **අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ.** කර්තෘ ප්‍රකාශන

සේනාධීර, සිල්වි සහ ශාමින්ද වනසිංහ (2016). **පර්යේෂණ ක්‍රමවේදය.** මරදානඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Anyon,j.(2009). **Theory and Education Research: Toward Critical Social Expalanetion**, London: Sage Publication

Burgess, R.G. (1991). in the Field: **An Introduction to the Field Research**.London:

Routledge Hammersley, M., and Atkinson (1983). **Ethnography, Principles in Practice**. London: Tavistock Publications

Hitchcock,G, and Hughes, D (1995). **Research and the Teacher**, London: Routledge.

Hussey, J. and Hussey, R. (1997) **Business Reseach.** London: Mcmillan Business.

Robertson,I, (1981) **Sociology**. New York: Worth Publications

Singleton, R. Straits, B.C. Straits, M.M. and Mcallister, R. J. (1988) **Approach to Social Research**. New York: Oxford university press.

Taff, R. (1990). **Ethnographic Research Method**, in Education Research, Methodology and Measurement: An International Handbook, (ed.) keeves, J.P. Oxford: Pergamon press.